**ශීර්ෂය 121- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වු දෙපාර්තමේන්තුවල ගිණුම් පිලිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු වල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.128,481,944,627 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.128,241,031,275 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.24,887,575 ක සිට රු.176,586,733 දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.03 සිට සියයට 18.04 ක් දක්වා පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 582,368,000 | 396,500,000 | 527,730,577 | 274,550,690 | 54,637,423 | 121,949,310 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 126,778,438,800 | 27,000,000 | 126,742,151,322 | 23,848,434 | 36,287,478 | 3,151,566 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 650,887,827 | 46,750,000 | 645,612,237 | 27,138,015 | 5,275,590 | 19,611,985 |
| | එකතුව | 128,011,694,627 | 470,250,000 | 127,915,494,136 | 325,537,139 | 96,200,491 | 144,712,861 |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 02 ක් විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේත 05 ක් සඳහා රු.මිලියන 12,608.5 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර අදායම් ලෙස රු.මිලියන 12,171.2 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 82.03 සිට 129.64 දක්වා පරාසයක ප්‍රතිශතයන්ගෙන් ආදායම රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණනන් දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | (අඩුවෙන් එකතු කිරීම)/වැඩියෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 10-03-07-99 | 108,531,000 | 123,160,170 | 14,629,170 | 113.48 |
| අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 20-04-01-00 | 8,105,000,000 | 8,333,779,290 | 228,779,290 | 102.82 |
| අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 20-04-02-00 | 4,150,000,000 | 3,404,247,640 | (745,752,360) | 82.03 |
| රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 10-03-02-00 | 77,000,000 | 92,306,547 | 15,306,547 | 119.88 |
| රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 10-03-07-02 | 168,000,000 | 217,795,350 | 49,795,350 | 129.64 |
| | | 12,608,531,000 | 12,171,288,997 | (437,242,003) | |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 121 | 12101 | 24,000,000 | 23,980,573 | 15,000,000 | 17,057,422 | 80,000,000 | 71,856,378 |
| 253 | 25301 | 20,000,000 | 19,999,132 | 18,000,000 | 19,178,779 | 140,000,000 | 81,268,630 |
| 254 | 25401 | 50,000,000 | 49,894,801 | 30,000,000 | 54,293,909 | 195,000,000 | 142,363,004 |

2.4 **අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

(අ) **අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු.143,959,401 ක්වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **2012 දෙසැම්බර් 31දිනට හර ශේෂය** |
|---|---|
| | රු. |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 3,975,085 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 139,984,316 |
| එකතුව | 143,959,401 |

(ආ) **පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.15,673,748 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **ගිණුම් අංකය** | **2012 දෙසම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | රු. |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0034/000 | 2,781,960 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0133/000 | 12,708,046 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0134/000 | 183,742 |
| එකතුව | | 15,673,748 |

## 2 කොටස
## එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

1. **ශීර්ෂය 121 - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

1.1 **විගණන විෂය පථය**

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසදුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා

සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු
නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ රු.9,426,037 ක්වූ වාහන මිලදී ගැනීම් දක්වා නොතිබුණු අතර අමාත්‍යාංශයට අයත් ජීප් රථවල වටිනාකම රු.154,252,398 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ලබා ගත් රු. මිලියන 36 ක් වූ වාහන 04ක් ඇතුළත් කර නොතිබූ අතර ඉවත් කරන ලද රු. මිලියන 2.9 ක් වූ වාහන දෙකක වටිනාකම ගලපා නොතිබුණි.

(iii) ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ වටිනාකම රු.මිලියන 46.7 ක් වැඩියෙන්ද මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකම රු.මිලියන 170.5 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

### (ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.4,300,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 30ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 95 අතර වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

අග්‍රිම නිකුත් කිරීම හා පියවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානවලට පටහැනිව පහත සඳහන් පරිදි කටයුතු කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(i) මාණ්ඩලික නොවන නිලධාරීන් 10 කට අවස්ථා 28 කදී එකතුව රු. 208,100 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) කාර්ය නිම කළ වහාම ලබාගත් තත් කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 14 කදී එකතුව රු. 247,500 ක්වූ අතුරු අග්‍රිම එක් එක් කාර්යයය නිම වී දින 30 සිට දින 228 දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

(iii) මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත් කාර්ය අතුරු අග්‍රිමය රු. 20,000 ක් වුවත්, අවස්ථා 11 කදී නිලධාරීන් 07 දෙනෙකු වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු. 349,959 ක තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඈ) තානායම් පාලනය හා නඩත්තුව පිළිබඳ ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 59005 දරන අත්තිකාරම් කටයුත්ත 1993 සැප්තැම්බර් 03 දින සිට ඇවර කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. පසුව එකතුව රු. 1,835,846 ක අයවිය යුතු ශේෂද එකතුව රු.1,551,082ක පියවිය යුතු ශේෂද හා එකතුව රු.1,508,723ක් වටිනා වත්කම්ද සම්බන්ධයෙන් කටයුතු කර අත්තිකාරම් ගිණුම ඇවර කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

(ii) **2**012 දෙසැම්බර් 31 දින වන විට රු.4,121,946 ක් වූ කාරක පාඩුවෙන් රු.2,306,799 ක ප්‍රමාණයක් කපා හැරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඉතිරි රු.1,815,147 ක කාරක පාඩුව කපාහැරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි.

(iii) තානායමකට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව තිබුණු බදු කුලී වටිනාකම රු.11,160,000 ක් වූ අතර එම ශේෂ වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාලයකට අදාල ඒවා විය.මීට අමතරව තානායම පිහිටි ඉඩමේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්වල පෙන්වා නොතිබුණි.

**1.4 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අමාත්‍යාංශයට අයත් වාහනයක් අළුත්වැඩියාව සඳහා දේශීය නියෝජිතයන් වෙත යවා ආපසු ගෙන්වා ගැනීමට මාස 30 කට අධික කාලයක් ගත වී තිබුණි. තවද අමාත්‍යාංශයට අයත් වෙනත් වාහනයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාස 14 ක කාලයක් ධාවනයෙන් ඉවත් කර අමාත්‍යාංශ භූමියේ ගාල් කර තිබුණි.

**1.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු වාහන 73 කින් වාහන 10 කට අදාල දෛනික ධාවන සටහන් පත් සහ මාසික කාර්යසාධන සාරාංශ, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර, ඉතිරි වාහන 63 ට අදාල මාස 03 ක් සඳහා වූ දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (අ), (ආ) සහ (ඇ) | ලොග් සටහන් පොත් සහ දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | |
| 2010 මැයි 14 දිනැති අංක සජ්/1/17/1 දරන චක්‍රලේඛයේ 3.1 ජේදය | චක්‍රලේඛ ප්‍රකාරව වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවත්, ඊට පටහැනිව වාහන 04 ක් අනුයුක්ත කර තිබුණි. |

**1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

විගණන නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

**(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

මාණ්ඩලික නිලධාරී නිවාස 16 ක් සහ තනිකඩව පදිංචි වීම සඳහා කාමර 48 කින් යුතු මහල් 09 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.114,300,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව 2001 ඔක්තෝබර් මාසයේ ආරම්භ කිරීමට යෝජිත වූ කොළඹ ගෝතමී පාරේ නිවාස ව්‍යාපෘතිය 2013 නොවැම්බර් මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

**(ආ) ප්‍රගතියක් ලබා නොතිබූ ව්‍යාපෘති**

ඉදිකිරීම් සඳහා ආයතනවලට සම්පූර්ණ මුදලම නිදහස් කර තිබූ නමුත් වැඩ පිළිබඳ නිසි ප්‍රගතියක් නොතිබූ අවස්ථා පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) 2006 වර්ෂයේදී නිවාස 1452 කින් යුතු නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියක් අරඹා තිබුණු අතර, 2012 වර්ෂය අවසාන වන විට නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම ඉංජිනේරුමය කටයුතු පිළිබඳ උපදේශක කාර්යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන ආයතන වෙත මේ වෙනුවෙන් එකතුව රු.5,019,262 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතියේ පස් පරීක්ෂාව සහ මූලික සැලැසුම් සකස් කිරීම හැර වෙනත් කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්වා නොතිබුණි.

(ii) මහනුවර කුණ්ඩසාලේ නිවාස 696 ක් ඉදිකිරීම සඳහා රු.2,728,828,261 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව 2010 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතිය වෙනුවෙන් 2012 වර්ෂය අවසාන වන විට රු.91,507 ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතියේ සමාරම්භක කටයුතු සහ පිඹුරුපත් සැකසීම හැර වෙනත් කිසිදු භෞතික ප්‍රගතියක් පෙන්වා නොතිබුණි.

## 1.7 කාර්යසාධනය

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳව කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ දිස්ත්‍රික් හා ග්‍රාම නිලධාරී පාලන, තොරතුරු තාක්ෂණ , මූල්‍ය හා සංවර්ධන අංශ විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණි.

(ආ) නවීන තාක්ෂණය යොදා ගැනීම, ක්‍රමෝපාය සැලැසුම් හා සම්පත් කළමනාකරණය, කාර්යාලීය ක්‍රම භාවිතය සරල කිරීම, තොරතුරු තාක්ෂණය භාවිතය හා පරිපාලන යටිතල සංවර්ධනය වැනි ක්ෂේත්‍රවලදී ක්‍රියාකාර සැලැස්මට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 1.8 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂය තුළ වාහන අනතුරු 20 කට අදාලව සිදු වූ මුළු අලාභයෙන් රු.136,258 ක්ද,2011 වර්ෂය දක්වා සිදු වී තිබූ අනතුරු 13 ක් සම්බන්ධයෙන් රු.2,485,109 ක්ද රක්ෂණ වන්දි මගින් අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 1.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අමාත්‍යාංශයට අදාල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මතු වූ කරුණු සම්බන්ධයෙන් 2010 ඔක්තෝබර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ, බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කර තිබුණි.

| යොමුගත විෂයය | සභාවේ නිර්දේශය | ලේකම්වරයාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාලිගාවත්ත මහ ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිලි වලින් රු.මිලියන 246 ක නිවාස කුලී අය නොකිරීම. | නිල නිවාස කුලී ඉක්මනින් අයකර ගැනීමටත් නඩත්තුව සඳහා එම ආයතන වෙතම ගොඩනැගිලි භාරදීමටත් කටයුතු කළ යුතුය. | 2012 දෙසැම්බර් මාසය වන විට පැවති හිඟකුලිය රු.මිලියන 246.6 ක් වේ.<br>2014 මාර්තු මාසය වන විට රු.මිලියන 147.2 ක් නිරවුල් කර ඇත. |

| | | |
|---|---|---|
| ඇවර කිරීමේ තානායම් පාලන අත්තිකාරම් ගිණුමේ බලය නොළත් කාරක පාඩු | මාස 06 ක් ඇතුළත අදාල ඇවර කිරීම් කටයුතු සිදුකර ශේෂ පියවා දැමීමට කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාරයේ එකගතාවය මත ඇවර කිරීමට අවශ්‍ය කටයුතු 2014 ජුනි 19 දින වන විටත් සිදුවෙමින් පැවතුණි. |
| අග්‍රහාර රක්ෂණ ක්‍රමය සංශෝධනය කිරීම යටතේ ණය සුරැකුම් රක්ෂණාවරණය ඇපයට තබා ණය ලබාගත් නිලධාරියෙකු සේවය හැර ගොස් ඇති විටක හෝ සේවයෙන් පහ කරනු ලැබූ විට රක්ෂණාවරණය යටතේ රක්ෂණ ආවරණය ලබාගත නොහැකි වීම. | ණය පැහැර හරින නිලධාරීන්ට අදාල ණය මුදල අග්‍රහාර රක්ෂණ භාර අරමුදලින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කරන ලෙස දෙන ලද නියෝගය. | මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කිරීමට භාණ්ඩාගාරය සමග සාකච්ජා කර ඇති අතර ඉදිරි පියවර ගැනීමට නියමිතව ඇත. |

## 1.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 71 | 61 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 16 | 14 | 02 | - |
| (ii) | ද්විතියක මට්ටම | 500 | 347 | 153 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 212 | 162 | 50 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 799 | 587 | 215 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 215 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය- 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 20 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධි විධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විශ්‍රම වැටුප් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව ඉතිරිය රු.7,674,713 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

**(ආ) ආදායම් ගිණුම්**

**(i) හිඟ ආදායම්**

ඉදිරිපත් කළ ආදායම් සංකේත 02 කට අදාළ එකතුව රු.2,860,160,139 ක්වූ ආදායම් හිඟහිටව තිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| ආදායම් සංකේතය | කාල විශ්ලේෂණය | | 2012 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|
| | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | |
| | රු. | රු. | රු. |
| 20-04-02-00 | 1,677,121,917 | 1,181,218,338 | 2,858,340,255 |
| 20-04-01-00 | 1,476,047 | 343,837 | 1,819,884 |
| එකතුව | 1,678,597,964 | 1,181,562,175 | 2,860,160,139 |

**(ii) ආදායම් සංකේතය 20.04.01.00 (සමාජ සංරක්ෂණ දායක මුදල් - මධ්‍යම රජය)-ආදායම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඇස්තමේන්තුගත ආදායම රු.8,105,000,000 ක් වුවත්, ආදායම් ගිණුම අනුව වර්ෂයේ ශුද්ධ ආදායම රු.8,333,779,290 ක් වී තිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුව රු.228,779,290 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබූ අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 2.82 ක් වී තිබුණි.

- හිඟ ආදායම ගණනය කිරීමේ විධිමත් ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව හිඟ ආදායම් නොමැති බව ගිණුමේ දක්වා තිබූ නමුත් රු.1,476,047 ක හිඟ ආදායම් පවතින බව විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

- ආදායමෙන් ආපසු ගෙවා තිබුණු රු.1,994,254 ක් පරීක්ෂා කිරීම සඳහා අදාල ආයතනවලින් ගෙන්වා ගත් හර නිවේදන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- එකතු කරන ලද ආදායම් පිළිබඳ වාර්තා දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවත්ව පවත්වාගෙන නොතිබුණු අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් උපයෝගී කර ගෙන ආදායම් ගිණුම පිළියෙල කර තිබුණි.

**(iii) සංකේතය - 20: 04: 02: 00 (සමාජ සංරක්ෂණ දායක මුදල් -පලාත් සභා) – ආදායම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඇස්තමේන්තුගත ආදායම රු.4,150,000,000 ක් වුවත් ගිණුම අනුව වර්ෂයේ ශුද්ධ ආදායම රු.3,404,247,640 ක් වී තිබුණි. වාර්ෂික ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම අතර ඌනතාවය රු.745,752,360 ක් වු අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 17.96 ක් විය.

- මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දිනට සහ දෙසැම්බර් 31 දිනට හිග ආදායම් කිසිවක් නොමැති බවට වූ හිස් වාර්තාවක් ඉදිරිපත් කර තිබූ නමුත් ආදායම් ගිණුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ රු.1,677,121,917 ක් හිඟ ආදායම් ලෙස දක්වා තිබුණි.

- රැස්කරන ලද ආදායම් පිළිබඳ වාර්තා දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු වුවත් , එක් එක් ආයතනයෙන් මාසිකව ලැබුණු දායක මුදල් පිළිබඳ වාර්තා විධිමත්ව පවත්වා නොතිබුණි.

- 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාසයකම ගිණුම් සාරාංශ මගින් හර හා බැර කරන ලද මුදල් පිළිබඳ වාර්තාවක් අදාල ආයතන විසින් ඊළග මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දන්වා තිබුණත් , ගිණුමට හර කර තිබූ රු.893,323 හා බැර කර තිබූ රු.333,098 ක් සම්බන්ධ වාර්තා එවා නොතිබුණු අතර ඒවා ගෙන්වා ගැනිමට ද ක්‍රියා කර නොතිබුණි.

- 2010 හා 2011 වර්ෂයන්ට අදාලව රු.මිලියන 1,181.2 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.1,002,023 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) 2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර හර ශේෂයෙහි රු.4,796 ක වෙනසක් විය.

**2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**2.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට 2014 ජනවාරි 20 දින ඉදිරිපත් කර තිබුණි.

**2.4.2** අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම රු.91,101,348 ක් වූ අතර 2010 හා 2011 වර්ෂවල එය පිළිවෙලින් රු.49,549,748 ක් හා රු.86,998,898 ක් විය. මෙම වැඩිපුර ගෙවීම වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම හැර වැඩිපුර ගෙවීම වලක්වා ගැනීම සඳහා වන සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 2,113,894 ක් වූ අතර , ඒවා වර්ෂයකට අඩු කාලයකට අදාල විය.

**2.6 අනුකූල නොවීම්**

2008 මැයි 27 දිනැති අංක වැද/ගිදමු/ආදායම් දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකර ප්‍රමාදයකින් තොරව සෑම මාසයක් අවසානයේදීම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. දායක මුදල් ප්‍රේෂණය කිරීමෙන් තොරව පළාත් සභා විසින් රඳවාගෙන තිබුණද එම දායක මුදල් ගෙන්වා ගැනීමට හෝ විධිමත්ව වාර්තා පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**2.7. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා.**

2007 වර්ෂයේදී ආරම්භ කර තිබූ ඉ - විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබූ අතර ව්‍යාපෘතිය සඳහා 2007 ජනවාරි මස සිට 2013 ජූනි 30 දින දක්වා වැටුප් හා වේතන හැර රු.182,223,229 ක් වැය කර තිබූ බව විගණනයේදී අනාවරණය විය.

**2.8 කාර්යසාධනය**

2012 වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) පාරිතෝෂිත ගෙවීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.74,600,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද පාරිතෝෂිත අයදුම් පත්‍ර ඉදිරිපත් කළ විශ්‍රාමිකයින් 2,465 ක් සඳහා 2012 දෙසැම්බර් 31 දින වන විටත් පාරිතෝෂිත ගෙවා නොතිබුණි.

(ආ) සංශෝධිත පාරිතෝෂිත ගෙවීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.400,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද 2012 දෙසැම්බර් 31 දින වන විටත් සංශෝධිත විශ්‍රාම පාරිතෝෂිත අයදුම්පත් ඉදිරිපත් කළ විශ්‍රාමිකයින් 2,083 ක් සඳහා සංශෝධිත පාරිතෝෂිත ගෙවා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සන්නද්ධ සේවා පාරිතෝෂිත ගෙවීම සඳහා ඉදිරිපත් කළ අයදුම් පත් 1,236 ක් සඳහා ගෙවීම් සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් මරණ පාරිතෝෂිත ගෙවීම සඳහා ප්‍රතිපාදන සළසා නොතිබු අතර ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්පත්‍ර 251 ක් වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි.

**2.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

වර්ෂ තුනකට වැඩි කාලයක සිට ගිණුම්වල පෙන්වා තිබුණු රු.4,025,574 ක් වූ අහරු චෙක්පත් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**2.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ හා පරිවර්තිත පාරිතෝෂිත ගෙවීමේ නව ක්‍රමය පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 6.1 , 6.2 , 6.3 සහ 6.4 වගන්තිවල විධිවිධානවලට පටහැනිව බදුල්ල සෞඛ්‍ය සේවා කාර්යාලයේ නිලධාරියෙකු වෙත මරණ පාරිතෝෂිත ලෙස රු. 261,288 ක් ගෙවා තිබුණි.

**2.11 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක විශ්‍රාමිකයන් මියයාමෙන් පසුවද මාස කීපයක් යනතුරු විශ්‍රාමිකයාගේ ගිණුමට එකතුව රු.1,006,810 ක් වූ විශ්‍රාම වැටුප ප්‍රේෂණය කර තිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | විශ්‍රාමිකයන් ගණන | වැඩිපුර ගෙවීම් |
|---|---|---|
| | | රු. |
| මොණරාගල | 13 | 188,821 |
| බුත්තල | 3 | 51,691 |
| දිඹුලාගල | 2 | 207,925 |
| බඩල්කුඹුර | 4 | 64,541 |
| වැල්ලවාය | 6 | 118,620 |
| මැදගම | සඳහන් කර නැත. | 375,212 |
| එකතුව | | 1,006,810 |

(ආ) විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවිම නිසා සිදුවී තිබුණු පාඩු හා හානි 2011 වර්ෂය සමග සැසඳීමේදි රු.33,928,977 ක් හෙවත් සියයට 43.6 ක් වැඩි වී තිබුණි.

(ඇ) නිලධාරියෙකු නිත්‍ය තනතුරින් පරිභාහිරව වෙනත් තනතුරක පිහිටුවා විශ්‍රාම ගැන්වීම හේතුවෙන් 2012 ජූනි 30 වන විට රු.557,199 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයන් හට වැඩිපුර ගෙවා තිබුණු මුදල් හානි හා පාඩු ලෙස හඳුනාගෙන විසර්ජන ගිණුමේ දක්වා තිබුණු අතර එසේ වැඩිපුර ගෙවූ මුදලින් 2012 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණු ශේෂය රු.111,743,342 ක් විය. එම ශේෂය වසර 5 සිට වසර 10 ත් අතර කාල පරාසයකට අදාල විය.

## 2.12 කළමනාකරණ දුර්වලතා

විශ්‍රාමිකයන්ගේ සුභසාධනය සඳහා වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනය පිහිටුවා තිබූ අතර මෙම නිකේතනයේ පාලනය සඳහා බංගලා භාරකරුවකු සහ කම්කරුවෙකු යොදවා තිබුණි. කාමර වෙන්කිරිම, මුදල් අය කිරිම, කුවිතාන්සි නිකුත් කිරිම, යතුරු භාරදිම, ඇණවුම් භාර ගැනිම ආදි කාර්යයන් සියල්ල බංගලා භාරකරු විසින් සිදු කිරිම නිසා එහි දුර්වල අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක වන බව නිරික්ෂණය විය.

## 2.13 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 19 | 03 |
| (ii) තෘතියික මට්ටම | 11 | 03 | 08 |
| (iii) ද්විතියික මට්ටම | 678 | 615 | 63 |
| (iv) ප්‍රාථමික මට්ටම | 75 | 65 | 10 |
| එකතුව | 786 | 702 | 84 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 84 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සේවක අනුයුක්ත කිරීමේදි අනුයුක්ත කළ යුතු සංඛ්‍යාව කෙරෙහි සැලකිලිමත් වී නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

| සේවක විස්තරය | අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව | අනුයුක්ත කළ යුතු සේවක සංඛ්‍යාව | අතිරික්තය හෝ (ඌනතාවය) |
|---|---|---|---|
| විශ්‍රාම වැටුප් නිලධාරී | 112 | 110 | 02 |
| ලේඛන සහකාර | 46 | 30 | 16 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 166 | 200 | (34) |
| කාර්යාල කාර්ය සේවක | 55 | 56 | (01) |

(iii) විශ්‍රාම වැටුප් නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීමේදී එම කාර්යාල වෙත පවතින විශ්‍රාමිකයන් සංඛ්‍යාව හෝ ලිපිගොනු සංඛ්‍යාව කෙරෙහි අවධානයෙන් තොරව නිලධාරින් අනුයුක්ත කර තිබුණි.

(iv) වව්නියාව, මුලතිව් , කිලිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත කිසිදු විශ්‍රාම වැටුප් නිලධාරියෙකු හෝ ලේඛන සහකාර නිලධාරියෙකු අනුයුක්ත කර නොතිබුණි.

## 3. ශීර්ෂය 254 -රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### 3.1 විගණන විෂය පථය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන , පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දිමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2012 නොවැම්බර් 28 දිනැති අංක IAI 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ | පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.11,750,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ත් සියයට 100 අතර පරාසයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 94 විධිවිධාන වලට පටහැනිව එක් වැය විෂයකට සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වූ ඉතිරිය රු.230,072 කින් ඉක්මවා රු.3,507,702 ක බැරකම්වලට එළඹ තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම්**

**(i) ආදායම් සංකේතය 10.03.02.00 (පැවරුම් බද්ද) ආදායම් ගිණුම**

2004 නොවැම්බර් 25 දිනැති අංක ප්‍ර.කෙ 01/15/2004 දරන රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ලිපියේ 05 වන ඡේදයට අනුව මෙරට දේපලක් විදේශිකයන්ට පැවරීමේදී ඔප්පුවේ සඳහන් දේපලේ වටිනාකම නියමිත වටිනාකමට අඩුවෙන් සඳහන් කර ඇති බවට අදාල ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාට සැකයක් ඇතිවන අවස්ථාවේදී එම දේපලේ වටිනාකම ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාවක් මගින් තහවුරු කරගත යුතු බව දක්වා තිබුණි. එම උපදෙස් පිළිබඳව නිසි සැලකිල්ලක් යොමුකර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

**(ii) ආදායම් සංකේතය 10.03.07.02 (ලියාපදිංචි කිරීමේ ගාස්තු) ආදායම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

❖ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.168,000,000 ක් වුවත් තථ්‍ය වශයෙන් රු.217,795,350 ක අදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම රු.49,795,350 කින් ඉක්මවා අදායම් රැස්කර තිබුණත්, ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

❖ ලියාපදිංචි කිරිමේ කටයුතුවලට අදාල මුද්දර හා වෙනත් ආදායම් පිළිබඳ මාසික වාර්තා අදාල මාසය අවසන් වි දින 15 ක් ඇතුළත ප්‍රාදේශිය හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් රෙජිස්ට්‍රාර්

ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු වුවත් ,එසේ කටයුතු කර නොතිබුණු අවස්ථාවන් විගණනයේදි නිරික්ෂණය විය.

- රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ වාර්තාවන්ට අනුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 6 ක එකතුව රු.24,451,183 හිඟ ආදායම් වාර්තා කර තිබුණත් ආදායම් ගිණුම අනුව හිඟ ආදායම් ලෙස රු.1,998,857 ක් පමණක් දක්වා තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2012 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබු සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු.3,634,804 ක් විය. එම හිඟහිටි ශේෂය තුළ විශ්‍රාම ගිය නිළධාරින් 194 දෙනෙකුගෙන් රු.1,165,565 ක ණය ශේෂද , මියගිය නිළධාරින් 16 දෙනෙකුගෙන් රු.409,060 ක්ද , වැඩ තහනම් කළ නිළධාරින් 16 දෙනෙකුගෙන් රු.909,498 ක් හා සේවය හැර ගිය නිළධාරින් 23 දෙනෙකුගෙන් රු.655,272 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින් දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති
අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 ඔක්තෝබර් 04 දින පිළියෙල කර තිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

2012 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් පෙන්වාදී තිබුණු අතිරික්ත , ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාල 33 ක අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

### 3.6 අනුකූල නොවීම්

**(අ) නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය සඳහා ද ඊට පෙර වර්ෂයන්ට අදාල වුද රෙජිස්ට්‍රාර් දිමනා බැරකම් යටතේ සඳහන් කර ගෙවීම් කර තිබු බව නියැදි විගණන පරික්ෂාවේදි අනාවරණය විය. මෙම තත්ත්වය දිගින් දිගටම සිදුකර තිබුණ මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව ප්‍රධාන ගණන් කිරිමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.7 අවිධිමත් ගනුදෙනු

**අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

2008 ජුනි මාසයේ සිට දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණියට පත්කළ නිලධාරීන්ගේ වැටුප් සැකසීමේදී, වැරදි වැටුප් කාණ්ඩයක හා වැරදි වැටුප් පියවරක තබා වැටුප් ගෙවා තිබුණි. ඒ හේතුවෙන් 2008 ජුනි මාසයේ සිට 2012 මැයි මාසය දක්වා උක්ත නිළධාරින්ගේ වැටුප් වෙනුවෙන් රු.3,545,536 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.8 පාඩු හා හානි**

වසර 10 කට පෙර සිදු වූ වාහන අනතුරකට අදාල රු.98,333 ක් වූ අලාභය හා 2009,2010 වර්ෂයන්වලදි සිදුවි තිබූ වාහන අනතුරු 02 කට අදාල රු.768,989 ක අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.9 කළමනාකරණ දුර්වලතා**

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 7ක් සම්බන්ධයෙන් සිදුකළ විගණන නියැදි පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 නොවැම්බර් 30 දිනට අයවිය යුතු හිඟ දඩ ශේෂය රු. 2,505,730 ක් වී තිබූ අතර ඉන් අවුරුදු 3 ඉක්මවා තිබූ ශේෂය රු.1,557,740 ක් විය.

(ii) 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ලියාපදිංචි කළ ඔප්පු 67,835 අතුරින් ඔප්පු 9523 ක දෙවන පිටපත් ප්‍රමාද වී භාර දී තිබුණි.

(iii) 2012 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා භාර නොදුන් දෙවන පිටපත් 976 සඳහා හා ප්‍රමාද වී භාර දුන් පිටපත් සඳහා සමථ මුදල් අයකර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 11 | 32 | - |
| (ii) තෘතියික මට්ටම | 47 | 58 | - | 11 |
| (iii) ද්විතියක මට්ටම | 2079 | 1189 | 890 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 451 | 399 | 52 | - |
| (v) වෙනත් (කොන්ත්‍රාත්) | - | 01 | - | 01 |
| එකතුව | 2620 | 1658 | 974 | 12 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 974 ක් පිරවීමටද බඳවාගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබාගැනීමටද දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.